පොළොන්නරුව මහා නගර සභාව - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පලාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 6.20 ප්‍රකාරව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසාන දිනට එක් එක් වත්කම් වලට අදාලව පිරිවැය, සමුච්චිත ක්ෂය,වාර්ෂික ක්ෂය සහ ශුද්ධ අගය දක්වමින් උපලේඛන සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත්, වත්කම්වල ශුද්ධ අගය පමණක් දක්වා තිබුණි.	නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් අයිතම 34 ක වටිනාකම රු.1,589,515 ක් දේපල පිරියත උපකරණ යටතේද තොග යටතේද වශයෙන් දෙවරක් සටහන් කිරීම හේතුවෙන් තොග වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති (LDSP - PT 03) යටතේ සමාලෝචිත වර්ෂයේ මිළදී ගෙන තිබූ ට්‍රැක්ටර් රථයේ වටිනාකම රු.4,299,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ඉකුත් වර්ෂ වල හා සමාලෝචිත වර්ෂය තුල ඉදිකර තිබූ රු. 4,997,783 ක් වටිනා පාලම් බෝක්කු මංමාවත් ශේෂ 03 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) සඳහා වූ බැංකු ජංගම ගිණුමෙහි මුදල් පොතට අනුව ශේෂය ශුන්‍යව තිබියදී, මූල්‍ය ප්‍රකාශන තුල රු.573,648 ක ශේෂයක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව. .
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ජංගම ගිණුම් වලට සෘජු ප්‍රේෂණ ලෙස ලැබී තිබු හා මුදල් පොතේ සිදුවු වැරදි නිවැරදි නොකිරීම් මත ඇතිව තිබූ ශේෂ මූල්‍ය ප්‍රකාශ වලට ගැලපීම් නොකිරීම මත රු.1,089,644 ක ආදායමක් මූල්‍ය ප්‍රකාශ වල ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ ඩිජිටල් දැන්වීම් පුවරු 03ක් මිළදී ගෙන සවිකිරීම සඳහා රු.12,124,500 ක වියදමක් දරා තිබුණ ද එය සවි කිරීම් යටතේ රු. 8,083,000 ලෙස රු.4,181,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(උ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අවසන් කර නොමැති ව්‍යාපෘති 03 ක් එම දිනට කලවැඩ වටිනාකම වූ රු. 12,349,807 ක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(ඌ)	නගර සභාවේ නිළධාරීන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් ආපදා ණය සඳහා අය කල රු. 3,167,509 ක ණය වාරික මුදල් හරස් සටහන් මගින් පුනරාවර්ථන වියදම්(වැටුප් හා වේතන) සඳහා ලැබීම් යටතේ සටහන් නොකර, මූල්‍ය ප්‍රකාශන වල අනුරාධපුර ආපදා ණය යටතේ ගෙවිය යුතු වියදමක් ලෙස දෝෂ සහගතව දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(එ)	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී LG 12 ආකෘතිය අනුව දේපල පිරියත උපකරණ මිලදීගැනීම වෙනුවෙන් මුදලින් සිදුකල වියදම් රු.48,385,103 ක් වුවද රු.90,747,270 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම වටිනාකම රු.42,362,167 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(ඒ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගෙවිය යුතු දෑ වැඩිවීම රු.32,116,930 ක් වුවද එය රු.67,239,147 ක් ලෙස රු.35,122,217 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.

(ඔ)	මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදි දිගුකාලීන ණය හා පොලිය ආපසු ගෙවීම රු.7,395,427 ක් වුවද එය රු.9,664,086 ක් ලෙස රු.2,268,659 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(ඕ)	මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලැබු පුනරාවර්තන නොවන ලැබීම් (LDSP) රු.46,773,750 ක් වුවද, එය ලැබූ ප්‍රග්ධන වියදම් ප්‍රදාන ලෙස රු.68,171,050 ක් ගිණුම් ගත කිරීමෙන් රු.21,397,300 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.
(ක)	සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් වලින් අය කරනු ලබන සියයට 1 ක බලපත්‍ර ගාස්තු හිඟ ආදායම වූ රු.453,526 ක් මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය නිවැරදිව ගිණුම්ගත ප්‍රකාශන මගින් නිවැරදි කළ යුතුය. කරන බව.

1.6.3 නොසැසඳු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව යන්ත්‍ර වටිනාකම රු.22,602,351ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වල එම වටිනාකම රු.40,661,865 ක් වූයෙන් රු.18,059,514 ක නොසැසඳීමක් පැවතුණි.	ලේඛනය නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු.107,472,915 ක් වූ ගිණුම් විෂයයන් 3කට අදාළ උපලේඛන, ශේෂ සනාථ ලිපි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරියට උපලේඛන සකස් කර ගැනීමට කටයුතු කරන බව.	නියමිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව	ටෙන්ඩර් හා කර්මාන්ත තැන්පතු ලෙස දක්වා ඇති සමාලෝචිත වර්ෂයේ අවසානයට වර්ෂ 02 ක් ඉක්මවා ඇති රු.16,622,002 ක් වටිනා තැන්පතු 40 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.	ආදායමට ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ අයහාරය රු.18,588,601 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයහාරය රු.712,753 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු	රු	රු	රු	රු	රු	රු	රු
(i)	වරිපනම් හා බදු	26,633,000	26,633,000	22,055,509	41,627,466	26,733,000	26,733,000	20,418,712	37,049,975
(ii)	කුලී	124,552,000	124,552,000	107,658,453	108,010,419	114,628,000	114,628,000	97,243,281	91,116,872
(iii)	බලපත්‍ර ගාස්තු	7,400,000	7,400,000	7,400,000	-	6,600,000	6,600,000	6,600,000	-
(iv)	වෙනත් ආදායම්	71,178,000	71,178,000	71,178,000	-	66,816,000	55,638,566	55,638,566	-
		229,763,000	229,763,000	208,291,962	149,637,885	214,777,000	203,599,566	179,900,559	128,166,847

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට හිඟ වරිපනම් බදු රු.23,042,739ක් සහ වර්ෂයේ බිල්කිරීමේ රු.19,059,245 ක් සමඟ රැස්කල යුතු වරිපනම් බදු වටිනාකම රු.42,101,984 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.18,495,678 ක් පමණක් රැස්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.23,606,307 ක් විය. මේ අනුව වරිපනම් බදු රැස්කිරීමේ කාර්යසාධනය සියයට 44 ක ඉතා පහළ අගයක් පවතින බවත්, වාර්ෂිකව වරිපනම් බදු හිඟය ඉහළ ගොස් තිබුණි.	රතු නිවේදන නිකුත් කිරීමටත් එසේ නොගෙවන්නන් සඳහා විනිග්‍රහන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ කසල බදු වටිනාකම රු.14,763,450 ක් විය.	නිරවුල් කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු දේපළ බදු ශේෂය රු.3,257,709 ක් විය.	අය විය යුතු හිඟ බදු ආදායම් අයකර ගැනීමට අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.86,632,306 ක් විය.	කඩ කාමර මුද්‍රා තැබීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එක්වන් මුදල් (කී මණී) ශේෂය රු.15,759,890 ක් විය.	ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වත්කම් බදු දීම**		
(i)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ලැබිය යුතු වත්කම් බදුදීම හා ප්‍රමාද ගාස්තු වටිනාකම රු.5,492,226 කින් සමාලෝචිත වර්ෂය තුල රු.253,117 ක මුදලක් පමණක් අයකර තිබූ අතර මේ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 5 ක ඉතා පහළ අගයක් පැවතුණි.	හිඟ වත්කම් බදු දීම් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සඳහා අධිකරණයේ නඩු පවරා ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වත්කම් බදුදීම හා ප්‍රමාද ගාස්තු ශේෂය රු.5,618,222 ක් විය.	අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

උතුරු මැද පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.28,391,775 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.10,830,453 ක් විය.	අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරමින් පවතින බව.	සහා ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
කඳුරුවෙල නව වෙළඳ සංකීර්ණය හා රථගාල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ විචලතා වැඩ හා අතිරේක වැඩ විෂයයන් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ රේටයන් පදනම් කර ගෙවීම් ගණනය කළ යුතු වුවද, ඊට වැඩි රේටයන් භාවිතා කර රු.11,404,818 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.	මහා සභා අනුමැතියට යටත්ව ගෙවීම්කර ඇති බව.	ගිවිසුම් ගත වන අවස්ථාවේ තිබූ රේටයන් පදනම් කරගෙන ගෙවීම් සිදු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 ජුනි 07 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පොල් කෙටීම වැනි ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී තිබූ රු.926,600 ක් අදාළ කටයුතු සඳහා යෙදවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.	අරමුදල් ලැබූ අරමුණට යොමු කරන බව.	අරමුදල් අදාල ව්‍යාපෘතිය සඳහා යොදා ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 කට වැඩි කාලයක සිට අය කර ගත යුතුව පවතින වැඩිපුර ගෙවන ලද මන්ත්‍රී දුරකථන හා ප්‍රවාහන දීමනා රු. 216,835 ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.	මෙම නිලධාරීන් මියගොස් හා විදේශ ගතව ඇති බැවින් නැවතත් ඔවුන්ගේ පවුල් වෙත ලිපි මගින් දැනුම්දී ඉදිරි කටයුතු ඉටු කරන බව.	වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2018 වර්ෂයේ තමන්කඩුව ප්‍රාදේශීය සභාව ඇවර කර වත්කම් වගකීම් බෙදා දීමේදී පොළොන්නරුව මහා නගර සභාවට ලබා දී තිබූ රු. 54,493,941 වටිනා ගිණුම් ශේෂ 04 ක් වසර 06 කට අධික කාලයක් ගතව තිබුණද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ පිළිබඳ කිසිදු තොරතුරක් සොයා ගැනිමට නොමැති බව.	ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය වන විට වසා තිබූ ව්‍යාපාර ආයතන 140 කට සහ කසල භාර නොගන්නා ආයතන 71 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම් සිදු කර තිබුණි. මෙසේ වාර්ෂික සමීක්ෂණයක් සිදු නොකර ගාස්තු අය කළ නොහැකි ආයතන සඳහා ද බිල් කිරීම හේතුවෙන්ව ව්‍යාජ හිඟ මුදලක් දක්වා තිබුණි.	2025 වර්ෂයේ කසල ලබා දෙන ආයතන හඳුනාගෙන ඒ අනුව කසළ බදු ලේඛනය යාවත්කාලීන කිරීමටත් පියවර ගන්නා බව.	නිවැරදි තොරතුරු ලබාගෙන ආදායම් ඇස්තමේන්තු කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ)	මහා නගර සභාව විසින් 2015 තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු අයකර තිබු අතර කාලීනව තක්සේරු කර ඒ මත පදනම්ව වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව වෙත විවිධ අවස්ථා වලදී ඉල්ලීම් කර ඇති බව.	වසර 05 කට වරක් දේපළ තක්සේරු කළ යුතුය.
(ඊ)	සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් වලින් අය කරනු ලබන සියයට 1 බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ආයතන 04 ක් වසර 02 සිට වසර 05 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශන නගර සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණද ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේදීද ගෙන නොතිබුණි.	ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කර නිවැරදිව ආදායම් රැස්කරගත යුතුය.
(උ)	කඳුරුවෙල නව වෙළඳ සංකීර්ණය හා රථගාල ඉදිකිරීමේ සැලසුම අනුව මෙම ගොඩනැගිල්ල වර්ග මීටර් 665.41 ක් වුවද, ඉන් සියයට 50 ක ප්‍රමාණයක් හිස් අවකාශ සහිතව සැලසුම් කිරීම හේතුවෙන් ආදායම් උත්පාදනය හා වැඩිදියුණු කිරීමට නොහැකි වීම මත මූල්‍ය ආර්ථික අවාසියක් නගර සභාවට සිදුවී තිබුණි.	ඇස්තමේන්තු හා සැලසුම අනුව ඉදිකිරීම සිදු කළ බව.	ආදායම් උත්පාදනයට සුදුසු ලෙස සැලසුම් සකස් කර ඉදිකළ යුතුය.
(ඌ)	කඳුරුවෙල නව වෙළඳ සංකීර්ණය හා රථගාල ඉදිකිරීමේදී විධිමත් පරිදි ශක්‍යතා අධ්‍යනයකින් තොරව නගරාධිපතිවරයාගේ වාචික උපදෙස් අනුව දෙමහල් ගොඩනැගිල්ල සිව් මහල් ගොඩනැගිල්ලක් බවට පත්කර තිබුණි. එහි අවශ්‍යතාවය අරමුදල් සපයා ගැනීම යන කරුණු කෙරෙහි අවදානය යොමු කර නොතිබුණි. අරමුදල් නොමැති වීම මත ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකර නොතිබුණි.	යලි සිදු නොවීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව.	ව්‍යුහය වෙනස් කිරීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් ඉතිරි වැඩ නිමකිරීමටත් කටයුතු කළ යුතුය.

3.3 නිශ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
සභාව සතු ට්‍රැක්ටරය සහ ට්‍රේලරය අවශ්‍යතාවයට නොගැලපීම මත වර්ෂ 02 ත් 03 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	අළුත්වැඩියාවන් සිදු කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය සිදු කළ යුතුය.

3.4 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
කඳුරුවෙල නව වෙළඳ සංකීර්ණය හා රථගාල ඉදිකිරීම සඳහා රු.29,700,000 ක දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් 2030 අප්‍රේල් මාසය වන විට ගෙවා අවසන් කල යුතු ණය මුදලක් මත සිදු කර තිබුණි. ව්‍යුහය වෙනස් කිරීම හේතුවෙන් අපේක්ෂිත ඉදිකිරීම අවසන් කිරීමට නොහැකි වීම මත සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වටිනාකම රු.5,967,461 ක් වාරික හා රු.3,722,616 ක් පොලිය වශයෙන් රු. 9,690,077 ක් හිඟව පැවතුණි.	ගෙවිය යුතු හිඟ ණය මුදල රු.9,690,077 ක් බව.	ණය වලට අදාල වාරික නියමිත දිනට ගෙවිය යුතුය.

3. 5 ප්‍රසම්පාදනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කදුරුවෙළ වෙළඳ සංකීර්ණය 2023 නොවැම්බර් 30 දින වන විට ඉදිකිරීම් අවසන් කර නොතිබියදී ජාතික තරගකාරීත්ව ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවා තිබුණද ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවීම මත ලංසු කැඳවීමට අදාල සියලුම කොන්දේසි වෙනස් කර නැවත 2024 ජනවාරි 29 දින ජාතික තරගකාරී ලංසු කැඳවීමක් නොකර තනි තනි කඩකාමර වෙනුවට සම්පූර්ණ ගොඩනැගිල්ලම ප්‍රාදේශීය තරගකාරී ලංසු ක්‍රමයට ටෙන්ඩර් කර තිබුණි.	ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රාදේශීය තරගකාරී ලංසු ක්‍රමය අනුගමනය කළ බව.	විධිමත් පරිදි බදු දීමට කටයුතු කළ යුතුය.
(ආ)	කඩකාමර වෙන් වෙන්ව බදු දීම සිදු කළේ නම් කඩකාමර 10 කට අදාළ තාවකාලික මාසික කුලිය රු.810,000 ක් වූ අතර එලෙස බදු නොදී එක් ටෙන්ඩර්කරුවෙකු වෙත බදු දීම තුළ මුළු වෙළඳ සංකීර්ණය සඳහාම තාවකාලික කඩ කුලී මුදල රු.400,000 ක් විය. ඒ අනුව මහා නගර සභාවට රු.410,000 ක මාසික අලාභයක් සිදු වී තිබුණි.	ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් පසු විධිමත් තක්සේරුවක් සිදු කර, එම කුලිය අයකිරීමට කටයුතු කරන බව.	විධිමත් පරිදි බදු දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කඩ කාමර 10 වෙන් වෙන්ව බදු දීම සිදු කරන්නේ නම් එක්වන් මුදල රු.5,500,000 ක් වන අතර එලෙස බදු නොදී එක් පුද්ගලයකු වෙත බදු දීම සිදුකරන විට එක්වන් මුදල රු.32,500,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මෙම අවස්ථාවේදී රු.18,000,000 ක පාඩුවක් මහා නගර සභාවට සිදුව තිබුණි.	ගැණුම්කරු විසින් එක්වන් මුදලින් සියයට 50 ක් එනම් රු.16,250,500 ක් ගෙවා ඇති අතර ඉන් රු.15,000,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

කදුරුවෙළ වෙළඳ සංකීණර්ය හා රථගාල ඉදිකිරීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳ සංකීරණය, දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට සැලසුම් සකස් කර ඊට අදාලව කොන්ත්‍රාත්කරු සමග එකඟව 2022 පෙබරවාරි 21 දින රු.32,497,815 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. සැලසුම් අනුමත කිරීමකින් තොරව සිව් මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට රු.65,783,475 ක නව ඇස්තමේන්තුවක් සඳහා 2022 අගෝස්තු 23 දින පැවති මහා සභාව මගින් අනුමත කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව නව ඇස්තමේන්තුව අනුව	එකම භූමියක කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වැඩ කිරීමේදී ගැටළු සහගත තත්වයක් ඇතිවිය හැකි බැවින් මහා සභා අනුමැතිය මත ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරු වෙතම පිරිනැමූ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	කොන්ත්‍රාත්කරු තෝරාගැනීම කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.		
(ආ)	අදාළ වෙනස් කිරීම මත අමතරව දැරීමට සිදුවන රු.36,083,475 ක මුදල සහා අරමුදලින් දැරිය හැකි ද යන්න පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකිරීම මත සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට සිදු කළ වැඩ කොටස් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු රු.22,558,607 ක මුදල ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි.	2025 ජනවාරි 16 දින වන විට වැඩ අවසන් බිල්පත් සඳහා කොන්ත්‍රාත්කරුට රු.22,558,607 ක මුදලක් ගෙවීමට ඇති බව.	වෙනස් කිරීම් සඳහා ප්‍රතිපාදන තිබේද යන්න පරීක්ෂා කර වෙනස් කිරීම් සිදු කළ යුතු බව.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.2 අනුව ඉටුකර ඇති වැඩවල ගුණාත්මකභාවය පිළිබඳව එකඟ වී ඇති පිරිවිතර, නියමයන් හා කොන්දේසි අනුකූලව වැඩ ඉටුකර ඇති බවට සහතික වීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු වුවද, අදාළ නිලධාරීන් විසින් උක්ත ඉදිකිරීමෙහි සියලු වැඩ සතුටුදායක ලෙස ඉටුකර ඇති බවට සහතික කර වැඩ අයිතම 06 ක් සඳහා රු.1,699,096 ක ඉටුනොකල වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කර තිබුණි.	පරික්ෂා කර බලා ගෙවීම් සහතික කර ඇති බව හා තීන්ත ආලේප කර කල් ගතවීමේදී අතේ ගෑවෙන ස්වරූපයක් දක්නට ඇති බව .	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.2 අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රමාණ පත්‍ර අනුව Slab, beam සහ staircase formwork කිරීම අයිතමයන් සඳහා 12 mm Laminated plywood shuttering යොදාගෙන ඇති බැවින්, එම සුමට පෘෂ්ඨ මත නැවත 15 mm ඝනකමින් යුතු ප්ලාස්ටර් යෙදීම අවශ්‍ය නොවන අතර, ඒ බව BSR හි උපදෙස් සඳහන් කර තිබියදී දළඹ කපරාදුව සඳහා රු.1,473,789 ක් ගෙවීම් නිර්දේශ කර තිබුණි.	මතුපිට රළුවට තබා ගැනීමට හා ඉදිකිරීම් ද්‍රව්‍යවල ආරක්ෂාවට Slab beam සහ Staircase සඳහා ප්ලාස්ටර් යෙදීම සිදු වූ බව.	BSR හි උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරු 6 ක්, ද්විතීයික මට්ටමට අයත් තනතුරු 28 ක්, ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 11 ක් වශයෙන් තනතුරු 45 ක් පුරප්පාඩුව පවතින බවත් අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ තනතුරු 06 ක් අතිරික්තව පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාල ආයතන වෙත දන්වා ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය.
(ආ)	ප්‍රාථමික මට්ටමට අයත් කාර්මික, පෙදරේරු, පැස්සුම්කරු, වඩු කාර්මික, කාර්යාල කාර්ය සහායක, ක්‍රීඩා භූමි භාරකරු, මාර්ග කම්කරු තනතුරු 05 ක් වශයෙන් තනතුරු 11 ක් පුරප්පාඩුව පවතින බවත්, රියදුරු තනතුරු 02 ක් , පුස්තකාල සහායක තනතුරක්, සෞඛ්‍ය	පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාල ආයතන වෙත දන්වා ඇති බව හා අතිරික්ත සේවකයින් අනුමැතිය සඳහා යොමු කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය.

	කම්කරු තනතුරක් වශයෙන් තනතුරු 04 ක් අතිරික්තව පැවතුණි.		
(ඇ)	මහා නගර සභාවේ විවිධ තනතුරුවල සේවයකරන නිලධාරීන් 56 දෙනෙකු තම නිත්‍ය තනතුරුවලට අදාල නොවන වෙනත් තනතුරුවල රාජකාරී වසර 01 සිට වසර 07 ක කාලයක සිට ඉටුකරමින් පැවතුණි.	පොළොන්නරුව මහා නගර සභාවේ තනතුරු අනුමත කිරීමේදි ඇතැම් තනතුරු විශාල ප්‍රමාණයක් අවශ්‍ය වුවද සීමා කර තනතුරු කිහිපයක් පමණක් අනුමත කර ඇති බැවින් අනෙකුත් සේවකයින් යොදා ගත් බව.	නිත්‍ය තනතුරුවලට අදාල රාජකාරී පැවරිය යුතුයි.

4. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

4.1 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ නියාමනය අනුව මහා නගර සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු, වැඩසටහන් හා නිර්ණායක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු වැඩසටහන් හා නිර්ණායක හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇති බව.	පනතේ දැක්වෙන අරමුණු, වැඩසටහන් නිර්ණායක වලට අනුකූල විය යුතුය.